විදුලි පණිවුඩ : " විශ්‍රාම වැටුප් " කොළඹ
தந்தி : "ஓய்வூதியம்" கொழும்பு
Telegrams : " PENSIONS " Colombo

දුරකථන / தொலைபேசி / Telephones: 2320316, 2421786, 2431305

ෆැක්ස් / பெக்ஸ் / Fax: 2342078

මගේ අංකය / எனது இல. / My No.: පෙන්/4042/ඊ

ඔබේ අංකය / உமது இல. / Your No.:

# විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
# ஓய்வூதியத் திணைக்களம்
# DEPARTMENT OF PENSIONS

මාලිගාවත්ත මහලේකම් කාර්යාලය,
මාලිගාවත්ත,
කොළඹ 10.

மாளிகாவத்தை செயலகம்,
மாளிகாவத்தை,
கொழும்பு 10.

Maligawatte Secretariat,
Maligawatte,
Colombo 10.

දිනය / திகதி / Date: 2005.01.04

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ 1/2005

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

## <u>2005 ජනවාරි මස විශ්‍රාම වැටුප ගෙවීම.</u>

2004.12.26 වෙනි දින ලංකාවේ බොහෝ ප්‍රදේශවලට බලපෑ ලද මුහුදු ගොඩගැලීමේ ඛේදවාචකය හේතුවෙන් ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල, බැංකු කාර්යාල හා තැපැල් කාර්යාලයන් ද විනාශයට පත් වී ඇති බව වාර්තා වේ. එමෙන්ම සැලකිය යුතු ප්‍රමාණයක විශ්‍රාමික මහත්ම, මහත්මීන් ද අතුරුදන් වීම හෝ අවතැන් වී ඇති බවද වාර්තා වේ.

මෙවැනි තත්ත්වයක් මත 2005 ජනවාරි මස 12 වෙනි දින ගෙවීමට නියමිත විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි ක්‍රියා කල යුතු බව කාරුණිකව දන්වමි.

1. මුහුදු ගොඩගැලීම හේතුවෙන් විශ්‍රාම වැටුප් කුවිතාන්සි යැවීම ගැටළු සහගත වන ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඊට සුදුසු වැඩපිළිවෙළක් සකස් කර ගත යුතු ය. ඒ අනුව විශ්‍රාම වැටුප් පරිගණක වැඩසටහන විනාශ වී ඇත්නම්, එය යථා තත්ත්වයට පත් කර ගැනීමට වහාම පියවර ගත යුතු යි.

2. එමෙන්ම කුවිතාන්සි යැවීම සහ බැංකු සහ තැපැල් කාර්යාල වෙත යැවිය යුතු අදාල ලැයිස්තු සකස් කර ගත නොහැකි අවස්ථාවලදී එකී බැංකු කාර්යාල සහ

තැපැල් කාර්යාල විමසා 2004 දෙසැම්බර් මස ගෙවනු ලැබූ විශ්‍රාම වැටුප පදනම් කොටගෙන ගෙවීම් කළ යුතු ය. ( දෙසැම්බර් මස වැටුප සමඟ යම් කිසි දීමනාවක් ගෙවා ඇත්නම්, එම මුදල ඉවත් කිරීමට සැලකිලිමත් විය යුතු ය.)

3. විශ්‍රාමිකයා සතු විශ්‍රාම වැටුප් හැඳුනුම්පත අස්ථානගත වී ඇති විට ග්‍රාම සේවා / සමාදාන විනිශ්චයකාර / රාජ්‍ය නිලධාරියකු / පූජ්‍ය/පූජක පක්ෂයේ කෙනෙකුගේ සහතිකය මත විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කරන ලෙස බැංකු හා තැපැල් කාර්යාල දැනුවත් කළ යුතු සි.

4. මෙසේ කටයුතු කිරීමේදී යම් ගැටළුදායක තත්ත්වයක් පැන නගින්නේනම් 2431647 හෝ 071-4858612 අමතා කඩිනමින් අදාළ උපදෙස් ලබා ගත යුතු සි.

කේ.ඒ.තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ